Worked.

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 11,411 — 1958 ජූලි 4 වැනි සිකුරාදා — 4.7.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

සී. 273 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය. | අතිරේක ආහාර ද්‍රව්‍ය

1950 අංක 29 දරණ මිල පාලන පනත

නියෝගය

මිළ (ආහාර) පාලක තැන්පත් කොටුවේ මුහන්දිරම් ධර්මසේන ජයනෙත්ති වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිළ (ආහාර) පාලක වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 මැයි 31 වෙනි දින, අංක 11,332 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1958 මැයි 30 වෙනි දින, සී. 269 දරණ ආහාර මිළ නියෝගයේ උප ලේඛනයේ 1 වෙනි තීරයෙහි සඳහන් මසූර්පරිප්පු, උලුඳු (පියලි නොකළ) කඩලපරිප්පු සහ අර්තාපල් පිළිබඳව, එම උප ලේඛනයෙහි 2, 3, සහ 4 වෙනි තීරයන්හි පිළිවෙළින් සඳහන්; පිටරටින් මෙරටට බඩු ගෙන්වන්නෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද, තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළ ද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ද්‍රව්‍ය, පිටරටින් මෙරටට බඩු ගෙන්වන්නෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් ද, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ, මේ දැන් පටන්, මේ උප ලේඛනයේ 2 වැනි, 3 වැනි හා 4 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මෙම උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍ය පිළිබඳව, 1958 මැයි 31 වෙනි දින, අංක 11,332 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතිරේක ආහාර ද්‍රව්‍ය සම්බන්ධ 1958 මැයි 30 වෙනි දින, සී. 269 වෙනි ආහාර මිළ නියෝගයේ (III) සිට (VIII) දක්වා ඡෙදයන්, මෙම නියෝගයෙහිම අන්තර්ගත වූ හැටියට සැළකිය යුතු ලෙසද මෙම නියෝගයෙන් නියම කරමි.

1958 ජූලි 3 වැනි දින, පස්වරු 4 ට කොළඹදී අත්සන් තබන ලදී.

ධර්මසේන ජයනෙත්ති,
මිළ (ආහාර) පාලක.

උපලෙඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| විස්තර | පිටරටින් බඩු ගෙන්වන්නකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | තොග වෙළෙන්දකු විසින් දළ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| මසූර් පරිප්පු ... ... ... | 52 58 ... | 53 58 ... | 0 54 |
| උලුඳු (පියලි නොකළ) ... ... | 45 76 ... | 46 76 ... | 0 47 |
| කඩල පරිප්පු ... ... | 38 79 ... | 39 79 ... | 0 40 |
| අර්තාපල් ... ... ... | 28 00 | 29 00 | 0 31 |

සැලකිය යුතුයි.—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. ඒවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නො විකිණිය යුතුයි.

1777—ජේ. ඇන්. ආර් 24757—4,360 (7/58) ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.